#mediaethicsSL #SinhalaPress #EnglishPress #Ika #CeylonToday #Mawbima

පාස්කු ඉරිදා ප්‍රහාරයන්ට සහභාගී වූ සියොන් පල්ලියේ ප්‍රහාරකයාගේ සිරුරේ කොටස්, එනම් හිස යළි ගොඩගෙන මඩකළපුව රෝහලට භාරදුන් බව මව්බිම පුවත්පතේ මෙන්ම සිලෝන් ටුඩේ පුවත්පතේද වාර්තා කොට තිබිණි. කෙසේ නමුත් මෙම සිරුරින් වෙන්වූ හිස කොටසේ ඡායාරූපයක්ද මව්බිම පුවත සමගින් පළ කොට තිබිණි. මෙහිදී අපට පැන නගින ගැටළුව වන්නේ, මෙම හිස කොටසේ සේයාරුවක් පළ කිරීම ප්‍රවෘත්තියට අවශ්‍යද යන්නයි. භීතිය හෝ තැතිගැන්ම ඇතිකරවන සුළු ඡායාරූප පළ කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය ආචාර ධාර්මික සීමාවන් තිබෙනා බව මෙහිදී සිහිපත් කර දිය යුතුවේ. එසේම මියගිය අයෙකු හඳුනා ගැනීම වැනි අරමුණක්ද මෙම පුවතට අදාළ නොවන බැවින්, මව්බිම ප්‍රවෘත්තිය සමගින් එවැනි සේයාරුවක් පළ කිරීම ප්‍රශ්න කළ යුතු යමක් බව අපගේ හැඟීමයි. එම ප්‍රවෘත්තියම වාර්තා කොට ඇති සිලෝන් ටුඩේ පුවත්පත මගින් එම සේයාරුව පළ කර නොමැති බවද නැවතත් සිහිපත් කළ යුතු වේ.